# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2024**
**2026 ජූලි / අගෝස්තු**

## මානවශාස්ත්‍ර පීඨය

## සාහිත්‍ය විචාරය

**ග්‍රීක රෝම යුගයන්හි සාහිත්‍ය නිර්මාණ හා සෞන්දර්ය සංකල්ප අධ්‍යයනය**
**LTCR 18214**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

01. "ග්‍රීසියෙහි භූගෝලීය සමාජ දේශපාලන සන්දර්භය, ස්වාධීන ලක්ෂණවලින් හෙබියා වූ ශිෂ්ටාචාරයක් ප්‍රභවය වීමෙහි ලා ප්‍රබල දායකත්වයක් සැපයූවේය." තත් මතයෙහි නිරවද්‍යතාව සනිදර්ශන ව විභාග කරන්න.

02. "පෞර රාජධානි සියල්ලෙහි ක්‍රියාත්මක වූයේ සපුරා සමාන දේශපාලන යාන්ත්‍රණයක් හෝ සංස්කෘතික සම්ප්‍රදායන් නොවේ." යථෝක්ත ප්‍රකාශයෙහි සත්‍යාසත්‍යතාව පරීක්ෂා කරන්න.

03. ට්‍රෝයි පුර සංග්‍රාමයට මාර්ගය විවර කළ හෙලන්ගේ චරිතය, **Iliad** හි (ත්‍රෝජපුර සංග්‍රාමය) නිරූපිත ආකාරය නිදර්ශනාත්මකව පැහැදිලි කරන්න.

04. ග්‍රීක සමාජය පිළිබඳ සාවධානව එහි පැවති දාර්ශනික සංවාදය කෙබඳු දැයි විමර්ශනය කරන්න.

05. ග්‍රීක නාට්‍යයෙහි ප්‍රභවය සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති මතවාද කවරේදැයි පරීක්ෂා කරන්න.

06. "කාව්‍යය වනාහී අනුකරණයයි" ඇරිස්ටෝටල්ගේ කාව්‍යශාස්ත්‍රයට (Poetics) අනුව විමසන්න.

07. "සොෆොක්ලීස් හා යුරිපිඩීස් යන ඛේදජනක නාට්‍යරචක දෙපළ පරස්පර විරෝධී ලෝක දෘෂ්ටියක පිහිටා සිය නිර්මාණ බිහිකළෝය." මෙහි සත්‍යාසත්‍යතාව පරීක්ෂා කරන්න.

08. කථා වින්‍යාසයෙහි පවත්නා සංකීර්ණතාව සොෆොක්ලීස්ගේ ඊඩිපස් රජ නාට්‍යාශ්‍රයෙන් විග්‍රහ කරන්න.

09. "කාව්‍යකරණය හා රසවින්දනය සම්බන්ධයෙන් ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරවාසීන් දැක්වූ ආකල්ප එකිනෙකට වෙනස්ය." නිදර්ශනාශ්‍රයෙන් තත් ප්‍රකාශයෙහි සත්‍යාසත්‍යතාව විභාග කරන්න.

10. "කාව්‍ය භාෂාව සම්බන්ධයෙන් හොරස් විසින් ප්‍රකාශිත අදහස්වල පවතින්නේ විශ්වසාධාරණ අගයකි." සනිදර්ශනව පහදන්න.

(සෑම පිළිතුරකට ම ලකුණු 20 බැගිනි)

**********************************